# 17
# ජාතික සංවර්ධන ක්‍රියාවලියේ ශ්‍රී ලංකා ගුවන්විදුලි භූමිකාව

**අසිත මල්ලවආරච්චි**

මානවයා වර්තමානය වන විට තොරතුරු ලෝකයකට අවතීර්ණ වී ඇත. මානවයාගේ සෑම සරල අවශ්‍යතාවක් සඳහා ම ජනමාධ්‍ය බලපෑම්කාරකයක් බවට පත් වී ඇති බව එහිදී පෙනී යයි. එහෙයින් පුද්ගල සංවර්ධනයට, ජාතික සංවර්ධනයට හා ගෝලීය සංවර්ධනයට තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රය කොතරම් දුරට අත්‍යවශ්‍ය වන්නේ ද යන්න විමසා බැලීම කාලෝචිත වන්නේ ය. පුළුල් ආකාරයෙන් සලකා බලන කල ජාතික සංවර්ධනයේ දී ජනමාධ්‍ය හුදෙක් ගාමක බලවේගයක් පමණක් ම නොවන අතර එය වර්තමානයේ කේන්ද්‍රීය සාධකයක් ලෙස ද හඳුනාගත හැකි ය.

සංවර්ධනය (Development) පිළිබඳ අදහස මුලින්ම බිහිවීම පිළිබඳ අවධානය යොමු කිරීම, සංවර්ධනය පිළිබඳ අදහස හොඳින් තේරුම් ගැනීම සඳහා වැදගත් වේ. පුද්ගල හෝ ආයතනික මෙන් ම ජාතික හෝ අන්තර්ජාතික විපරිණාමයන් ගණනය සඳහා 'ප්‍රගතිය' (Progress) යන අර්ථය දීමට මෙන් ම සංකල්පිත සැලකිල්ලක් ලෙස සංවර්ධනය (Development) යන්නෙහි පෘථුල භාවිතයත් පශ්චාත් ද්විතීය ලෝක සංග්‍රාමය සමඟ බැඳුණු සංසිද්ධියක් වූ බව හඳුනා ගත හැකි ය. 1994 දශකය තුළ දී මෙන් ම 50/60 දශකවල, සංවර්ධනය යන්න වර්ධනය (Growth), නවීකරණය (Modernization), විපරිණාමය (Change), ප්‍රජාතන්ත්‍රවාදය (Democracy), ඵලදායීත්වය (Productivity), කාර්මීකරණය (Industrialization) සහ ඒ සමාන ඓතිහාසික විපරිණාමයන් ගණනාවක් සඳහා ම පර්යාය පදයක් බවට පත්විය. මුලින් ම ඇමරිකාවේ වියතුන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් ජනප්‍රියත්වයට පත් කරනු ලැබ වැඩිකල් නොගොස් ම යුරෝපය හා ලෝකයේ අවකාර්මික රටවල ද හඳුන්වා දෙනු ලැබූ 'සංවර්ධනය' නැමති පදය සාවද්‍ය ලෙසින් නිර්වචනය කරනු ලැබූවක් මෙන් ම, සර්ව භෞමික වශයෙන් අර්ථය හඳුනා ගනු ලැබූවක් නොවුව ද, ජාත්‍යන්තර සංවිධානයක් තුළ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්විය (කරුණානායක, 2000: 40).

සංවර්ධනය අද වන විට පර්යේෂණයන් සඳහා භාජනය වන පහසු වචනයක් ලෙස පෙනෙන්නකි. නමුත් එහි අන්තර්ගතය සංකීර්ණය. ආර්ථික, දේශපාලන, සංස්කෘතිය, මානවවිද්‍යාව, ග්‍රාමීය සමාජ විද්‍යාව, අන්තර්ජාතික සම්බන්ධතා, අන්තර්ජාතික සන්නිවේදනය ආදී ක්ෂේත්‍ර ගණනාවක් තුළ සිදු කළ ව්‍යාපෘතීන් රැසක ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදය තුළ සංවර්ධන අධ්‍යයන කටයුතු පුළුල් විය. 1960 දශකයේ මුල් භාගය තුළදී සංවර්ධනයේ සුවිශේෂී ප්‍රගතීන් හඳුනාගන්නට ලැබුණි.

සංවර්ධනය යන වචනය දෙවන ලෝක යුද්ධයේ අවසානය දක්වා ම සාහිත්‍යගත වූයේ නැත. බොහෝ විට සංවර්ධනය යන්නෙන් හැඟීගියේ 'බටහිරකරණය' හෙවත් 'යුරෝපීයකරණයයි'. පශ්චාත් සංග්‍රාම යුගයේ දී මුල් දශක තුළ දී සංවර්ධනය යන වචනයෙහි ජනප්‍රියතාව වැඩිවෙත් ම ලෝකයේ ජනගහනයෙන් සහ සමාජයෙන් බහුතරය හැඳින්වීම සඳහා භාවිත වූ 'නොදියුණු' (Backward) යන වචනය ටිකෙන් ටික දුරස් වී ඌන සංවර්ධිත (Under–Development) සහ සංවර්ධනය (Development) යන වචනය භාවිතයට ගෙන ඇත. දෙවන ලෝක සංග්‍රාමයට පසු කාලය තුළ සංවර්ධනය ප්‍රධාන කරුණු හතරක් විස්තර කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත.

එනම්,

1. නවීකරණය, ජාතිවාදය සහ දේශපාලනික සංවර්ධනය.

2. ආර්ථික සංවර්ධනය සහ තාක්‍ෂණික විද්‍යා ව්‍යාප්තිය.

3. අධිරාජ්‍යවාදය සහ ඌන සංවර්ධිතභාවය.

4. විප්ලවය, විමුක්තිය සහ මානව සංවර්ධනය (කරුණානායක, 2000: 42).

සංවර්ධනයේ මහා වටිනාකම් තුනක් පිළිබඳ සමාජ ආර්ථික සංවර්ධන පර්යේෂකයෝ සාකච්ඡා කරති. ඉන් පළමුවැන්න මූලික අවශ්‍යතා සම්පූර්ණ වීමයි. දෙවැන්න පුද්ගල ස්වීයත්වය හා ගරුත්වයයි. තෙවැන්න නිදහසයි. මයිකල් පී. ටොඩාරෝ හා ස්ටෙපෙන් සී ස්මිත් (Michael P. Todaro, Stephen C. Smith - 2008) යන ආර්ථික විද්‍යාඥයින් පෙන්වා දෙන ආකාරයට සංවර්ධනයට මූලික අරමුණු 03 කි.

(i) ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය සුරක්ෂිතතාව වැනි ජීවන පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සුලබ කිරීම හා බෙදාහැරීම.

(ii) රැකියා අවස්ථා, අධ්‍යාපන අවස්ථා නිර්මාණයන් මානව හා සංස්කෘතික වටිනාකම් නිර්මාණය තුළින් ඉහළ ආදායම් ලැබීමට අමතරව ජීවන මට්ටම උසස් කිරීම.

(iii) මිනිසුන් සඳහා වඩාත් පුළුල් ආර්ථික, සමාජ අවස්ථා විවෘත කිරීමෙන් ඔවුන් යටත්භාවයෙන් හා වහල්භාවයෙන් මුදවා ගැනීම (ලියනගේ, 2010: 24).

'මුල් කාලීන සමාජයේ සංවර්ධනය යන්න සලකන ලද්දේ, ආර්ථිකය පදනම් කොටගත් සංඛ්‍යානමය මිනුම් දඬුවලින් හසුකර ගත හැකි භෞතික දියුණුවයි. නමුත් පසුකාලීනව එය ප්‍රතික්ෂේප විය'' (ජිනදාස, 2011: 158). 1982 මෙක්සිකෝ නගරයේ පැවැත්වුණු ජාත්‍යන්තර සමුළුවකදී සංවර්ධනය යන්නට පුළුල් අර්ථ නිරූපණයක් ලබා දී ඇත. සංවර්ධනය යනු ආර්ථික වර්ධනය ඉක්මවා පැතිරෙන සංකීර්ණ, පුළුල් හා බහුමානීය ක්‍රියාවලියක් බවත් මෙම ක්‍රියාවලියට ජන ජීවිතයට අදාළ සියලු අංග ද ඔවුන්ගේ ශක්තිය ද ඇතුළත්ව සමස්ත ජනතාවටම එම ක්‍රියාවලියට දායක වී ඒ තුළින් ලැබෙන වාසි සියල්ල භුක්ති විඳීමයි" (කරුණානායක, 2001: 23).

මැටි, පුවරු, බට පතුරු, පුස්කොළ ආදිය මත සලකුණු තබමින් සන්නිවේදනය කළ මිනිසා, එයින් මිදී පරිගණකය හා අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලෝකයට ඇද දමන විශ්වකර්ම තාක්‍ෂණය, සංවර්ධනයේ දොරගුළු බවට පත්ව ඇත. සන්නිවේදනමය වශයෙන් පුවත්පත, ගුවන්විදුලිය, සිනමාව, රූපවාහිනිය යන සියල්ලම පරිගණකය තුළ කේන්ද්‍රගත වුව ද ඒ එක් එක් මාධ්‍යයෙහි පවතින අනන්‍යතාව හා ස්වාධීනතාව මුළුමනින් ම අහෝසි වී නැත. අහෝසි වන්නේ ද නැත. එහෙයින් තොරතුරු මූලාශ්‍රයයක් ලෙස මෙන් ම සංවර්ධන මෙවලමක් ලෙස ද ඒ එක් එක් මාධ්‍ය සතු ශක්‍යතා එලෙසම පවතියි.

ගුවන්විදුලිය සියවසකට ආසන්න කාලයක් සන්නිවේදනයේ යෙදීම හේතුකොටගෙන සංස්කෘතික වශයෙන් මිනිසාට බලපෑම්කාරී වීමට හේතුකාරක වේ. එහිදී සියවසකට වඩා වැඩි කාලයක් මිනිසාට පවතින තොරතුරු අවශ්‍යතාව සපුරාලමින් විනෝදාස්වාදය හා පොළඹවමින් මිනිස් ජීවිත හා බද්ධ වී ඇත. එක් අතකට ගුවන්විදුලි විකාශයක් ආරම්භ කළ පළමු බ්‍රිතාන්‍ය යටත් විජිතය ද වන්නේ ශ්‍රී ලංකාවයි. තවත් වසර 05කින් ශ්‍රී ලංකා ගුවන්විදුලි වංශකතාවට සියවසක් පිරීම තවත් වැදගත් සන්ධිස්ථානයකි.

ගුවන්විදුලිය සංවර්ධනය සඳහා යොදාගතහැකි මාධ්‍යයක් වියයුතු බවට මුල්වරට සාකච්ඡා වන්නේ, 1941 වෛද්‍යනාදන් කොමිෂන් සභා වාර්තාව තුළින් ය. "ගුවන්විදුලිය විනෝදාස්වාදන මාධ්‍යයක් පමණක් නොව, අධ්‍යාපන හා ප්‍රවෘත්ති මාධ්‍යයක් වශයෙන් ද රටේ මනා පාලනයක් ඇති කිරීමට මාහැඟි මෙවලමක් ලෙස ද භාවිත කළ යුතුය. ලංකාවේ නොදියුණු ප්‍රදේශවල ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට

ගුවන්විදුලි මාධ්‍ය යොදාගත යුතුය" (කරුණානායක, 1990, 44 පිටුව). මෙරට පළමු ප්‍රාදේශීය ගුවන්විදුලි සේවය ලෙස රජරට සේවය 1979 අප්‍රේල් මස 12 වනදා ආරම්භ කරන ලදී. ප්‍රාදේශීය ගුවන්විදුලි සේවයක අභිමතාර්ථ අතර ප්‍රජා සහභාගීත්වය, වර්ධනය හා සංවර්ධනය පහසුකරණය මෙහිදී ප්‍රමුඛ වේ. රජරට සේවය ආවරණය කරන පොළොන්නරුව, කුරුණෑගල, මාතලේ, පුත්තලම, අනුරාධපුරය, ත්‍රිකුණාමලය හා වව්නියාව යන දිස්ත්‍රික්ක ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ පිහිටීම හා මෙරට කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඉහළ දායකත්වයක් සපයන ප්‍රාදේශය සීමා කරමින් පැවතීම ද වැදගත් වේ. ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික සංවර්ධන ක්‍රියාදාමයන්ට මේ තුළින් වූ දායකත්වය සුළුපටු නොවේ.

සංවර්ධනය වන රටවල ගුවන්විදුලි සේවාවන්ට සංවර්ධනය වූ රටවල ආදර්ශයන් දැඩි ලෙස බලපාන ලදී. විශේෂයෙන් ම අප්‍රිකානු රටවල් 36 න් රටවල් 7 ක් හැර අනෙක් සියලුම රටවල්වල ගුවන්විදුලි ආකෘති පිහිටුවා ඇත්තේ යටත් විජිත පාලනය මගින් ය. "1937 දී බ්‍රිතාන්‍ය රජය විසින් යටත් විජිතවාදී ගුවන්විදුලි සේවාවන් පවත්වාගෙන යාමේ අරමුණු හා අපේක්ෂාවන් ප්ලීමත් කමිටු වාර්තාවේ විස්තරාත්මක ව දක්වා ඇත" (ප්ලීමත් කමිටු වාර්තාව, 1937, 56 පිටුව). මේ ආකාරයට ආරම්භවන ලංකාවේ ගුවන්විදුලිය, ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය දක්වන ආකාරය පිළිබඳ පසු විපරම් කිරීම කාලෝචිත වන්නේ ය.

"ගුවන්විදුලිය සංවර්ධනය වන රටවලට අවතීර්ණ වූයේ, යටත්විජිතවාදී අත්දැකීම්වල සෘජු ප්‍රතිඵලයක් වශයෙන් යැයි කීම නිවැරදිය. යටත් විජිත සතුව තිබූ බොහෝ බටහිර රටවල් ඒවායේ ගුවන්විදුලිය හඳුන්වා දුන් ගුවන්විදුලි ආකෘතීන් එම බටහිර රටවල ඇතිවූ, එම රටවල අවශ්‍යතා පිරිමැසීමට උචිත සමාජ ආර්ථික හා දේශපාලන රටාවක් පැනනැගුණ අතර ඒවා බොහෝ අවස්ථාවලදී කිසිදු වෙනස්කමක් හෝ සංශෝධනයක් නොමැතිව සංවර්ධනය වන රටවලට බද්ධ කෙරිණි" ( කරුණානායක, 1990: 20).

සංවර්ධනය වන ලෝකයේ ප්‍රචලිතම සන්නිවේදන මාධ්‍ය ගුවන්විදුලි මාධ්‍යයයි. විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ක්‍රමයන්ගෙන් ගුවන්විදුලිය උපයෝගී කොටගෙන තිබේ. එහි වූ අරමුණු අතර,

1. පෙලඹවීම.
2. දැනුම හා තොරතුරු සැපයීම.
3. ඉගැන්වීම.
4. චර්යාව වෙනස් කිරීම
5. සංස්කෘතික අඛණ්ඩතාව හා වෙනස්වීම් ඇති කිරීම (කරුණානායක, 1990: 28-31). ප්‍රධාන කොට සැලකිය හැක.

රූපවාහිනිය නැරඹීමේ දී වුව ද අකුරු හැකියාවක් නොමැති ග්‍රාහකයෙකුට විවිධ අර්ථ බාධක මැද අතරමංවන අවස්ථා පවතී. නමුත් ගුවන්විදුලි භාවිතය තුළ එබඳු බාධකයක් නොමැති වීම එය සතු ප්‍රබලතාවකි. මහාචාර්ය කේ. එස්. සීතාරාම් පෙරදිග ජන සමාජය ඇසුරින් පවත්වන ලද පර්යේෂණ හා එහි නිගමන සලකා බැලීමේ දී මෙය වඩාත් පැහැදිලි වේ. ඔහු පැවැත් වූ පර්යේෂණ තුළින් අනාවරණය කළ හැකි වූ වැදගත් නිගමන දෙකකි,

- ජාතික සංවර්ධනය වනාහි කිසිවකින් වියුක්ත නොවුණු සංකල්පයක් වන අතර එමගින් සමාජ ආර්ථික හා සංස්කෘතිකමය පාර්ශ්වයන් නියෝජනය කරයි. එහිදී ගුවන්විදුලිය නිසි ප්‍රගතිශීලි ක්‍රියාදාමයක් මත ක්‍රියාත්මක විය යුතු ය. පෙර සඳහන් කළ පරිදි සංවර්ධන අරමුණු කෙරෙහි ලාංකීය ගුවන්විදුලියේ අවධානය යොමු වී තිබූ බවට සාක්ෂි බොහෝ වේ. එය ජාතික සංවර්ධන ක්‍රියාදාමයට අවශ්‍ය පදනම සකස් කිරීමක් ලෙස සැලකිය හැකි ය.

- තොරතුරු සම්පාදනය කිරීමේ දී නාගරික සුළු කොට්ඨාසයක් පමණක් ශ්‍රවණය කිරීම සීමා වනවාට වඩා රට පුරාම විසිරුණු බහුතර ජන කොට්ඨාසයක් ආවරණය කෙරෙන ගුවන්විදුලියක් ප්‍රචාරණය කිරීමේ

අවශ්‍යතාව මෑත කාලීනව මතු වී ඇත. එයට තාක්ෂණික සාධකය ප්‍රබල වන අතර ම ජාතික ගුවන්විදුලිය හා ප්‍රාදේශීය ගුවන්විදුලිය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම වැදගත් වේ. නමුත් වර්තමානයේ ප්‍රාදේශීය හා ප්‍රජා ගුවන්විදුලියේ විකාශන තත්ත්වය හා වැඩසටහන්වල ගුණාත්මකබව විමසිල්ලට ලක්කළ යුතුය. අනෙක් අතට ඊට සාපේක්ෂව ග්‍රාහක කොට්ඨාසය වර්ධනය කිරීම හා එය පවත්වාගෙන යාමේ වැදගත්කම ද අවධාරණය කළ යුතුය. ඒ තුළින් පොදු ජන මාධ්‍යයක් ලෙස මෙන් ම ඉන් ඔබ්බට ගිය මාධ්‍යයක් ලෙස ද ජනගත කිරීමට හැකියාව ලැබේ. එහි අවසන් ඵලය ජාතික සංවර්ධනයට අවශ්‍ය ජනතා පෙළගැස්වීම සිදු වීමයි.

මෙකල ළමයින්ගේ අධ්‍යාපනය සඳහා විවිධ ක්‍රම යොදාගෙන ඇත. සංවර්ධනය වූ රටවල වැඩිමහල්ලන්ගේ අධ්‍යාපනික දියුණුව සඳහා නොයෙකුත් මාර්ග යොදා තිබේ. එම මාර්ග අතර ගුවන්විදුලිය මුල්තැන ගනියි. "ලංකාව වැනි පහසුකම් නොමැති රටක, දැනුම දියුණු කරගැනීමට ද ප්‍රවෘත්ති දැනගැනීමට ද කෘෂිකාර්මික තොරතුරු දැනගැනීමට ද ගුවන්විදුලිය තරම් ප්‍රබල මාධ්‍යයක් නොමැති බව 1935 Radio Times සඟරාවට ලිපියක් ලියමින් එඩ්වඩ් හාපර් පෙන්වා දී ඇත" (නානායක්කාර : 2006 : පිටුව 16). මේ ආකාරයට වර්තමානය තුළ ද වැඩසටහන් නිෂ්පාදනය කිරීමේ අවශ්‍යතාව පවතියි. ජාතික ගුවන්විදුලි නාලිකා ප්‍රමාණාත්මකව වැඩිවීමත් සමඟ ම ඇතිවන තරගකාරීත්වය පසෙක ලා වැඩසටහන්වල අන්තර්ගතය පිළිබඳව සැලකිලිමත් වීම ජාතික සංවර්ධනයට අවශ්‍ය පෙලඹවීමක් ලෙස පෙන්වා දිය හැකිය.

යම්කිසි රාජ්‍යයක් තුළ හෝ අභ්‍යන්තර ප්‍රදේශයක් තුළ ඇති වන්නා වූ ජාතික මට්ටමේ අර්බුදයක් හෝ ආපදාවක් ඉතා ඉක්මනින් වාර්තා කිරීමේ ජංගමශීලී මාධ්‍යයක් ලෙස ගුවන්විදුලි මාධ්‍යයට හිමිවන්නේ සුවිශේෂී තැනකි. මාරාන්තික රෝග, වසංගත, දේශගුණික විපර්යාසයන් ආදිය පිළිබඳ තොරතුරු සම්පාදනය කරමින් ග්‍රාහකයා ක්ෂණිකව දැනුම්වත් කිරීමේ හැකියාව, ගුවන්විදුලියට පවතින ශක්‍යතාවකි.

සංවර්ධනයෙන් සමාජ වෙනස්කම් සිදුකිරීමේ දී ගුවන්විදුලියේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් මතවාදීමය වෙනසකට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ අවශ්‍යතාව පවතියි. මෙම ප්‍රතිපත්ති සකස් කිරීමේදී අපට Denis Mcquail ගේ අදහස් වැදගත් වේ.

- ප්‍රධාන සමාජ වෙනස්කම්වලදී මාධ්‍යයෙහි භූමිකාව කුමක්ද ?
- මාධ්‍යයන් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වීමේදී ප්‍රගතිශීලී හෝ සාම්ප්‍රදායික වන්නේද ?
- සංවර්ධන සංදර්භය තුළ දී මාධ්‍ය වෙනස් කිරීම සඳහා මාධ්‍යයන් යොදාගත හැකිද ?
- මාධ්‍යයන් ඵලදායි ලෙස විසර්ජනය වනවාද ?

යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය (Mcquail, 2010, page 92).

ජාතික සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය හා ප්‍රජා ගුවන්විදුලියෙන් සිදුවන සේවය සුළු පටු නොවේ. එහිදී අදාළවන භාෂාමය, සංස්කෘතික, සමාජීය විවිධත්වයන්ට අනුකූලවන ලෙස වැඩසටහන් නිෂ්පාදනය කිරීමට ප්‍රාදේශීය ගුවන්විදුලිය හා ප්‍රජා ගුවන්විදුලියට පවතින ශක්‍යතාවන් ප්‍රබල ය. මෙය ලංකාව හැරුණු විට ඉන්දියාව, බ්‍රිතාන්‍ය, චීනය වැනි රටවල ප්‍රබලාකාරයෙන් ක්‍රියාත්මක වේ. එහිදී එකිනෙකට වෙනස් ප්‍රදේශවල ජීවත්වන විවිධ ජාතිකයන්ට අයත් ජන කොට්ඨාසයන්ට ස්වකීය දෛනික කටයුතු ඉටු කිරීමෙහිලා ගුවන්විදුලියෙන් ලැබෙන පිටුබලය ප්‍රබලය.

අනෙක් අතට ලංකාව තුළ සමාජීය ලෙස එකම ජන කොට්ඨාසයක් ලෙස පිළිගැනුනත් අභ්‍යන්තර වශයෙන් පරස්පර සංස්කෘතික විරෝධීතාවන් දැකිය හැකිය. මෙවැනි තත්ත්වයන් තුළ ඒ ඒ කලාපීය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ගුවන්විදුලි මධ්‍යස්ථාන ප්‍රමාණාත්මකව වැඩිකර ඒ මඟින් කලාපීය අනන්‍යතාවට සරිලන ලෙස සන්නිවේදන ක්‍රියාවලිය පවත්වාගෙන යාම සිදු කළ යුතුය. මෙවැනි තත්ත්වයන් ඉන්දියාව හා චීනය තුළ ප්‍රබලව දැකිය හැකි ය. විශේෂයෙන් ම ඉන්දියාව තුළ ජාතික හා ප්‍රාදේශීය ගුවන්විදුලි තවදුරටත් ප්‍රජා අවශ්‍යතාවන් වෙනුවෙන් කටයුතු කරයි.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල ක්‍රියාත්මක ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවන් තුළින් අපේක්ෂිත ප්‍රමුඛතම පරමාර්ථ උපුටා දැක්වීම මෙහිදී වැදගත් වේ.

- ප්‍රාදේශීය වශයෙන් වැදගත්වන කාලීන පුවත් සන්නිවේදනය බැගින් ස්වකීය ජන සමාජය හා එහි පැවැත්ම පිළිබඳ ඔවුන් තුළ වන නිවැරදි අවබෝධය වැඩිදියුණු කිරීම.

- අදාළ ශ්‍රවණ කලාපයේ ජනතාව සතු සංස්කෘතික උරුමයන් පවත්වාගැනීමට හා ආරක්ෂා කරගැනීමට උපකාරි වීම.

- සාම්ප්‍රදායික සමාජ කොට්ඨාසයන් වෙත නව ආකල්ප හා නව සමාජ ක්‍රියාකාරීත්වයන් හඳුන්වා දීම.

- ද්විතීයික අධ්‍යාපන කාර්යය ලෙස ළමා හා වැඩිහිටි ශ්‍රාවක ප්‍රජාව තුළ සමාජාවබෝධය තහවුරු කිරීම.

- අදාළ කලාපයට සුවිශේෂි කෘෂි හෝ වෙනත් කර්මාන්ත හා ජීවනෝපාය ක්‍රම දියුණු කිරීමෙහිලා රුකුල් දීම හා ඒ කෙරෙහි ඔවුන් පෙලඹවීම.

- ශ්‍රාවක කලාපීය ජන සමාජයේ රුචිය හා රසවින්දන තත්ත්වය ඉහළ තලයකට රැගෙනයාමට අදාළ පසුබිම සකස් කිරීම.

- ශ්‍රාවක සමාජය සතු නිර්මාණ ශක්‍යතා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අත්‍යවශ්‍ය පසුබිම ගොඩනැගීම.

- සංවර්ධනාභිමුඛ නව සමාජ සංවාදයන් කෙරෙහි ශ්‍රාවකයා පෙලඹවීම හා ඒ සඳහා ඔවුන් සහභාගී කරවීම.

- ජනමාධ්‍ය පරිහරණයෙහිලා ජනතාව දැනුම්වත් කිරීම හා ඒ කෙරෙහි ඔවුන් දක්වන දායකත්වය හා සහභාගීත්වය වර්ධනය කිරීම.

- ප්‍රාදේශයෙහි පවත්නා ගැටලු හඳුනාගැනීම, ඒ සඳහා වන විසඳුම් පිළිබඳ තීරණ ගැනීම හා ක්‍රියාමාර්ග භාවිතය සම්බන්ධ ස්වාධීනත්වය අදාළ සමාජය තුළ ගොඩනැගීම.

- අදාළ ජන සමාජයේ විවිධ සමාජ කොට්ඨාස අතර පැවතිය යුතු සාමය, සමඟිය හා අන්‍යෝන්‍ය සහජීවනය යන්න සමාජ සාධනයෙහිලා පසුබිම සැකසීම.

- අදාළ ප්‍රාදේශීය අනන්‍යතාව සහිත සමාජාරක්ෂණය, සමාජ සංවිධානය හා සමාජානුයෝජන ක්‍රියාවලිය මඟින් යහපත් සමාජයක් නිර්මාණය කිරීමට උපකාරී කිරීම (නානායක්කාර : 2006 : පිටු 1819).

මේ අනුව ප්‍රාදේශීය තත්ත්වයන්ට ආවේණික වූ යථෝක්ත අරමුණු ඉටුකරගැනීමට ප්‍රාදේශීය ගුවන් විදුලි මාධ්‍ය ක්‍රියාත්මක කිරීමේ ජාතික අවශ්‍යතාවක් වර්තමානයේ උද්ගත වී ඇත. ඒ තුළින් ජාතික සංවර්ධනයට ප්‍රාදේශීය වශයෙන් වන දායකත්වය වැදගත් වේ. සංවර්ධනය සඳහා වන ගුවන්විදුලි වැඩසටහන් හඳුනාගැනීම හා ඒවායේ පවතින ගැටලු සහ ඊට අදාළ විසඳුම් විශ්ලේෂණය කිරීම, එමඟින් නිර්ණය කිරීම, දේශීය අවශ්‍යතා සපුරාලන සංවර්ධන යෙදවුම්, ප්‍රවේශයන් විවෘත කිරීම ආදිය මෙහිදී වැදගත් කොට සැලකිය හැකි ය.

ලෝකයේ සිටින දුප්පත්ම ජන කොටස් වෙත එළඹීම සඳහා වඩාත් ම පුළුල් ලෙස ලෝක පරිමාණයෙන් භාවිත කළ හැකි ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන මෙවලම වන්නේ ගුවන්විදුලියයි. එහිදී සංස්කෘතික ප්‍රකාශනය, ප්‍රවෘත්ති සහ තොරතුරු, සංවාදය සහ සංවර්ධනය අරබයා ප්‍රජාවගේ දෑතට ලබා දියහැකි මාධ්‍යමය මෙවලම ගුවන්විදුලිය බව උක්ත කරුණුවලින් පැහැදිලි වේ. එයට හේතුව ජනතාවට ලෙහෙසියෙන් ම ප්‍රවේශ විය හැකි ජංගමශීලී මාධ්‍යයක් වීමයි. ජාතික සංවර්ධනය, යථාර්ථයක් බවට පත් කරගැනීමට නම් ලාංකීය ගුවන් විදුලියේ අරමුණු හා ක්‍රියාකාරීත්වය වර්තමානයේ වෙනස්විය යුතු බව පෙන්වා දිය හැකි ය. මූල්‍යමය ගැටලු, පරිපාලන අර්බුද හා දේශපාලන මැදිහත්වීම අවම කරගනිමින් යථෝක්ත අරමුණ සාක්ෂාත් කර ගැනීමට සියලු දෙනාම

ක්‍රියාකාරී විය යුතුය. ඒ තුළින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට බලපෑම්කාරී මාධ්‍යයක් බවට අප ගුවන්විදුලියට පත් විය හැකි බව අවධාරණය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

කරුණානායක, නන්දන, (2001). සන්නිවේදනය සහ සංවර්ධනය, දිවුලපිටිය : සරස්වතී ප්‍රකාශන.

කරුණානායක, නන්දන, (1990). 66 වසරක ගුවන්විදුලි ඉතිහාසය, කර්තෘ ප්‍රකාශනයකි.

ලියනගේ, චමිල, (2010). කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශීය ගුවන්විදුලිය, වැලිවේරිය : සඳකඩපහන ප්‍රකාශන.

දිසානායක, විමල් (2009). සංවර්ධන හා සන්නිවේදනය, කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නානායක්කාර, සේන (2008). සංවර්ධනාත්මක සන්නිවේදනය, කර්තෘ ප්‍රකාශනයකි.

දිසානායක, විමල් (2009). සංවර්ධන හා සන්නිවේදනය, කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නානායක්කාර, සේන (2008). සංවර්ධනාත්මක සන්නිවේදනය, කර්තෘ ප්‍රකාශනයකි.

විතානගේ, චන්ද්‍රසෝම (1993). තුන්වන ලෝකයේ සංවර්ධන සන්නිවේදනය, කොට්ටාව : සාර ප්‍රකාශන.

ජිනදාස, මනෝජ් පුෂ්පකුමාර, (2011). සංවර්ධනය, පර්යේෂණය හා මහජන සම්බන්ධතාව, කර්තෘ ප්‍රකාශනයකි.

ලක්හඬ, ලක්හඬ සන්නිවේදන පියහසර, (2006), බොරැල්ල : සදීපා ප්‍රකාශන.

Denis McQuail, (2010), Mass Communication Theory, Sage Publication.